සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

# 2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර් (නව නිර්දේශය)

09 S I, II

පැ තුනයි

## (09) සෞඛ්‍ය විද්‍යාව - I, II

2019.12.27 /12.30 - 15.40

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සෞඛ්‍ය විද්‍යාව - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

### I කොටස

1. බෞද්ධ දර්ශනය අනුව ශරීරය සහ ලෝකය නිර්මාණය වී ඇත්තේ,
   (1) කිසියම් සර්ව බලධාරී දෙවියෙකුගේ මැවීමක ප්‍රතිඵලයක් අනුව ය.
   (2) වසර කෝටි ගණනක් තිස්සේ සිදුවූ පරිණාමය හේතුවෙනි.
   (3) ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන ඉකාටස්වලින් ය.
   (4) ජීවියා ඉබේ හට ගැනීමෙන් ය.

2. කුඩා කාලයේ සිට ගිහිගෙයින් නික්ම සසුනට පැමිණි භික්ෂූන් වහන්සේලාගේ "කායික, මානසික, සමාජයීය හා ආධ්‍යාත්මික යහපැවැත්ම" සඳහා පිරිවෙන් පරිසරය සෞඛ්‍යවත්ව පවත්වා ගත යුතුවේ. ඉහත කළු අකුරින් සඳහන් ප්‍රකාශය පැහැදිලි වනසේ දක්වා ඇති වඩාත් සුදුසු වචන වන්නේ,
   (1) සෞඛ්‍ය ප්‍රවර්ධනයයි. (2) පූර්ණ සෞඛ්‍යයයි.
   (3) පූර්ණ පෞරුෂයයි. (4) නිරෝගී භාවයයි.

● සෞඛ්‍ය ප්‍රවර්ධන පිරිවෙන් සංකල්පයට අනුව සිරිපවර පිරිවෙණෙහි ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් A, B, C, හා D යන ඉංග්‍රීසි අක්ෂරවලින් පහත දක්වා ඇත. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක 3, 4 සහ 5 ට පිළිතුරු සපයන්න.
   (A) පිරිසිදු ජල පහසුකම් සැපයීම
   (B) අසල්වාසීන් හා එක්ව පිරිවෙන පිරිසිදු කිරීම සඳහා ශ්‍රමදාන පැවැත්වීම
   (C) පිරිවෙන් සිසුන් වෙනුවෙන් මුඛ සෞඛ්‍ය සායන පැවැත්වීම
   (D) කැළි කසළ නිසිලෙස බැහැර කිරීම

3. මෙම ක්‍රියාකාරකම් අතුරෙන් සෞඛ්‍යවත් ප්‍රතිපත්ති දක්වා ඇති ඉංග්‍රීසි අක්ෂර වන්නේ,
   (1) A සහ B ය. (2) A සහ D ය.
   (3) B සහ D ය. (4) C සහ D ය.

4. සිරිපවර පිරිවෙනේ සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම සඳහන් ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
   (1) A ය. (2) B ය.
   (3) C ය. (4) D ය.



Department of Examinations Sri Lanka

5. සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා කරන ලද ප්‍රජාසහභාගිත්ව ක්‍රියාකාරකම් දක්වා ඇති ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
   (1) A ය. (2) B ය.
   (3) C ය. (4) D ය.

6. සෞඛ්‍යවත් නොවන පිරිවෙන් පරිසරයක ඇතිවිය හැකි අහිතකර චිත්තවේගයක් වන්නේ,
   (1) සතුට ය. (2) අනුකම්පාව ය.
   (3) සහකම්පනය ය. (4) අප්‍රසන්න බව ය.

7. පුද්ගලයෙකුගේ ජීවිතයේ විවිධ අවධි අනුපිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.
   (1) ළමා විය, තරුණ විය, නව යොවුන් විය, වැඩිහිටි විය, මැදිවිය
   (2) ළමා විය, නව යොවුන් විය, තරුණ විය, මැදිවිය, වැඩිහිටි විය
   (3) ළමා විය, නව යොවුන් විය, මැදිවිය, තරුණ විය, වැඩිහිටි විය
   (4) ළමා විය, තරුණ විය, නව යොවුන් විය, මැදිවිය, වැඩිහිටි විය

● භික්ෂූන් වහන්සේලාගේ නම් සහ වයස දැක්වෙන පහත සඳහන් ලේඛනය උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක **8** සහ **9** ට පිළිතුරු සපයන්න.

| භික්ෂූන් වහන්සේලාගේ නම | වයස (අවුරුදු) |
|---|---|
| සමාධි | 09 |
| සුධීර | 17 |
| රාහුල | 25 |
| විමල | 45 |

8. ලේඛනයේ සඳහන් භික්ෂූන් වහන්සේලා අතුරෙන් සංක්‍රාන්ති සමයේ පසුවන්නේ,
   (1) සමාධි භික්ෂූන් වහන්සේ ය. (2) සුධීර භික්ෂූන් වහන්සේ ය.
   (3) රාහුල භික්ෂූන් වහන්සේ ය. (4) විමල භික්ෂූන් වහන්සේ ය.

9. රාහුල භික්ෂූන් වහන්සේ පසුවන්නේ,
   (1) නවයොවුන් වියෙහි ය.
   (2) තරුණ වියෙහි ය.
   (3) මැදි වියෙහි ය.
   (4) වැඩිහිටි වියෙහි ය.

10. නවයොවුන් වියට පත්වූ භික්ෂූන් වහන්සේ නමක් තුළ ඇතිය හැකි වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.
   *A* – ස්වාධීනව කටයුතු කිරීමට කැමති වීම
   *B* – නිර්මාණශීලි වීම
   *C* – සමාජශීලි වීම

   ඉහත දැක්වෙන වෙනස්කම් අතුරෙන් මානසික වෙනස්කම් වනුයේ,
   (1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය.
   (3) *B* සහ *C* ය. (4) *A*, *B* සහ *C* ය.

11. වැඩිහිටි වියෙහි පසුවන භික්ෂූන් වහන්සේලා විසින් නොකළ යුත්තේ,
   (1) අපථ්‍ය ආහාරවලින් වැලකීම (2) වයසට ගැළපෙන ලෙස ව්‍යායාමයෙහි නිරත වීම
   (3) වැඩිපුර විවේක ගැනීම (4) ප්‍රජාව සමඟ ඇසුර නවතා දැමීම

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

2288

12. පාරම්පරික ක්‍රම අනුව සකසා ගත් ආහාර පමණක් අඩංගු පිළිතුර වන්නේ,
   (1) හත්මාලුව, කලවම් පලා මැල්ලුම, කොළකැඳ, තැම්බුම් හොදි
   (2) හත්මාලුව, කොළකැඳ, නූඩ්ල්ස්, තැම්බුම් හොදි
   (3) කොළකැඳ, තෙම්පරාදු බත්, පිට්ටු, හත්මාලුව
   (4) කොළකැඳ, තෙම්පරාදු බත්, රොටි, කලවම් පලා මැල්ලුම

- පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
   * සුදුසු ආහාර තෝරා ගැනීම.
   * නුසුදුසු ආහාර පානාදියෙන් වැලකීම
   * ප්‍රමාණය දැන අනුභව කිරීම
   * සුදුසු වේලාවට අනුභව කිරීම

13. භික්ෂූන් වහන්සේලා විසින් ඉහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකළ යුත්තේ,
   (1) ආහාර පරිභෝජනයට ප්‍රථම අවස්ථාවේදී ය.
   (2) ආහාර පරිභෝජන අවස්ථාවේදී ය.
   (3) ආහාර පරිභෝජනයෙන් පසු අවස්ථාවේදී ය.
   (4) ආහාර අන් අයට දෙන අවස්ථාවේදී ය.

14. ප්‍රමාණය නොදැන ආහාර අනුභවයෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵලයක් වන්නේ,
   (1) රෝගාබාධ අඩු වීම ය.
   (2) සිරුරේ සැහැල්ලු බව ඇති වීම ය.
   (3) අලසකම ඇති වීම ය.
   (4) කාය ශක්තිය වැඩි වීම ය.

15. පහත දී ඇති ප්‍රකාශය හා හේතුව සම්බන්ධව දෙන ලද වගන්ති අතුරෙන් නිවැරදි වගන්තිය තෝරන්න.

   ප්‍රකාශය – සංඝ සමාජය සඳහා දානය පිළියෙල කිරීමේ දී වැඩි වශයෙන් ස්වාභාවික ආහාර තෝරා ගැනීම වඩාත් සුදුසුවේ.

   හේතුව – සංඝ සමාජය තුළ යහපත් පෝෂණ තත්ත්වයක් ඇති කළ යුතුවේ.

   (1) ප්‍රකාශය හා හේතුව සත්‍ය ය.
   (2) ප්‍රකාශය හා හේතුව අසත්‍ය ය.
   (3) ප්‍රකාශය සත්‍ය වන අතර හේතුව අසත්‍ය ය.
   (4) ප්‍රකාශය අසත්‍ය වන අතර හේතුව සත්‍ය ය.

16. බුදු දහමේ සඳහන් පරිදි අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය ප්‍රතික්ෂේප කිරීමෙන්,
   (1) මන්දපෝෂණය වලක්වා ගත හැකිවේ.
   (2) අධිපෝෂණය වලක්වා ගත හැකිවේ.
   (3) ස්ථූලතාව වලක්වා ගත හැකිවේ.
   (4) මන්දපෝෂණය සහ අධිපෝෂණය වලක්වා ගත හැකිවේ.

17.




ඉහත සටහනේ හිස්තැන පිරවීමට වඩාත් සුදුසු වචන දක්වා ඇති වරණය තෝරන්න.
   (1) ආහාරවල පෝෂණයට හානි වන අවස්ථා
   (2) ආහාරවල පෝෂණ ගුණය වැඩි කර ගත හැකි අවස්ථා
   (3) ආහාර කල්තබා ගත හැකි අවස්ථා
   (4) පෝෂ්‍යදායි ආහාර තෝරා ගත හැකි අවස්ථා

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations, Sri Lanka

18. මිනිස් හෘදය පිහිටා ඇත්තේ,
   (1) උරස් කුහරයේ පෙනහලු දෙක අතර තරමක් වම් පැත්තට බරව ය.
   (2) උරස් කුහරයේ පෙනහලු දෙක අතර තරමක් දකුණු පැත්තට බරව ය.
   (3) උරස් කුහරයේ පෙනහලු දෙක අතර තරමක් ඉහළින් ය.
   (4) උරස් කුහරයේ පෙනහලු දෙක අතර තරමක් පහළින් ය.

19. පස්වන ශික්ෂාපදය කඩකිරීම හේතුවෙන් වැළඳිය හැකි රුධිර සංසරණ පද්ධතිය හා සම්බන්ධ බෝනොවන රෝගයක් වන්නේ,
   (1) ලියුකේමියාව ය. (2) හිමොෆිලියාව ය.
   (3) පීනස ය. (4) හෘද අකර්මණ්‍ය ය.

20. රුධිර සංසරණ පද්ධතියේ කිසියම් නාළ වර්ගයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
   - බිත්ති ඝනකම් ය. ප්‍රත්‍යාස්ථ ය.
   - මෙම නාළ තුළ රුධිර ගමන වේගවත් ය.
   - මෙම නාළ තුළ ඇති රුධිරයේ ඔක්සිජන් සාන්ද්‍රණය වැඩි ය. කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රණය අඩුය. (එක් විශේෂිත නාළයක හැර)

   ඉහත ලක්ෂණ සහිත නාළ වර්ගය කුමක් ද?
   (1) ධමනි (2) ශිරා (3) ධමනි හා ශිරා (4) කේශනාලිකා

21. ක්ෂීරපායි සත්ත්වයන්ගේ රුධිර සෛල පිළිබඳ පහත සඳහන් ලක්ෂණ සලකා බලන්න.
   A – න්‍යෂ්ටියක් අඩංගු වේ.
   B – රතු ඇට මිදුලු තුළ නිපද වේ.
   C – ආයුකාලය සතියක් පමණ වේ.
   D – ඇමීබාකාර චලන දක්වයි.

   ඉහත සඳහන් ලක්ෂණ අතුරෙන් රතු රුධිරාණු සෛල, සුදු රුධිරාණු සෛල හා පට්ටිකාවලට පොදු ලක්ෂණය අඩංගු වරණය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය,
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

22. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ආහාර මාර්ගය දෙපසින් ම (උඩ සහ යට) විවෘත වූ නාළයක් ලෙස හැඳින්විය හැකි ය.
   (2) ජීරණයටත් අවශෝෂණයටත් භාජනය වූ ආහාරවල ජලය හා ලවණ උරා ගනු ලබන්නේ මහාන්ත්‍රය මගිනි.
   (3) ජීරණය වූ ආහාර අවශෝෂණය කරනු ලබන්නේ ආමාශයෙනි.
   (4) උණ්ඩුකය හා උණ්ඩුක පුච්ඡය යන අවයව යුගල ආහාර ජීරණය සඳහා ප්‍රයෝජනවත් කාර්යයක් ඉටු නොකරයි.

23. මොළය මගින් ඉටු කරන කාර්ය කිහිපයක් පහත දක්වා ඇත.
   *A* – දේහයේ සමතුලිත බව රැක ගැනීම
   *B* – හෘද ස්පන්දනය පාලනය කිරීම
   *C* – මතකය, දැනුම, බුද්ධිය වැනි මානසික ක්‍රියා පාලනය කිරීම

   ඉහත කාර්ය ඉටු කිරීම සඳහා දායක වන මොළයේ කොටස් නිවැරදි අනුපිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ,
   (1) අනුමස්තිෂ්කය, සුෂුම්නා ශීර්ෂකය, මස්තිෂ්කය
   (2) අනුමස්තිෂ්කය, මස්තිෂ්කය, සුෂුම්නා ශීර්ෂකය
   (3) සුෂුම්නා ශීර්ෂකය, මස්තිෂ්කය, අනුමස්තිෂ්කය
   (4) සුෂුම්නා ශීර්ෂකය, අනුමස්තිෂ්කය, මස්තිෂ්කය



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

● අංක **24, 25** සහ **26** ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම සුදුසු වචනය තෝරන්න.

24. මූත්‍රාශයේ තැන්පත් වන මුත්‍ර ශරීරයෙන් බැහැර කෙරෙන්නේ ...................... ඔස්සේය.
(1) වකුගඩු (2) මුත්‍ර වාහිනී (3) වෘක්ක (4) මුත්‍ර මාර්ගය

25. මිනිස් දේහයේ බහිස්‍රාවී ඉන්ද්‍රියයක් ලෙස ...................... ක්‍රියා කරයි.
(1) සම (2) ගුද මාර්ගය (3) ගුදය (4) උණ්ඩුක පුච්ඡය

26. වෘක්කවල හෝ මුත්‍රාශයේ ...................... ලවණ ස්ඵටික (කැට) බවට පත්වීමෙන් මූත්‍රාගල් සෑදේ.
(1) කැල්සියම් ඔක්සලේට් (2) අයඩීන්
(3) පොටෑසියම් (4) සෝඩියම්

27. මිනිස් සිරුර තුළ රෝගවලට ඔරොත්තු දීම සඳහා ස්වභාවයෙන් ම පිහිටි ශක්තිය සහ හැකියාව,
(1) ස්වභාවික ප්‍රතිශක්තිය යි. (2) පරිචිත ප්‍රතිශක්තිය යි.
(3) කෘතිම ප්‍රතිශක්තිය යි. (4) ප්‍රතිශක්තිකරණය යි.

28. ළදරුවකු ඉපදී පැය 24 ක් ඇතුළත ලබාදෙන එන්නත මගින් වළක්වා ගත හැකි රෝගය නම්,
(1) පෝලියෝ ය. (2) ක්ෂය රෝගය ය. (3) ගලපටලය ය. (4) කක්කල් කැස්ස ය.

29. බෝනොවන රෝග වැළදීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ,
(1) අයහපත් ජීවන රටා ය.
(2) ජානමය සාධක ය.
(3) අයහපත් ජීවන රටා සහ ජානමය සාධක ය.
(4) අනාරක්ෂිත ලිංගික සබඳතා ය.

කිසියම් රෝගයක් පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක **30** ට සහ **31** ට පිළිතුරු සපයන්න.

- මෙම රෝගයේ රෝග වාහකයා ඊඩිස් ඊජිප්ටයි හා ඊඩිස් ඇල්බොපික්ටස් යන මදුරු විශේෂ වේ.
- දින ගණනක් පවතින තද උණ, හිසරදය, ඇඟපත වේදනාව ආදිය මෙම රෝගයේ සාමාන්‍ය ලක්ෂණ වේ.
- මෙම රෝගයේ අසාධ්‍ය තත්ත්වයේ දී හම යට කුඩා ලේ පැල්ලම් මතු වේ.

30. මෙම රෝග තත්ත්වය නම්,
(1) මැලේරියාව ය. (2) ඩෙංගු ය. (3) බරවා ය. (4) ජලභීතිකාව ය.

31. මෙම රෝගයේ රෝග කාරකයා,
(1) බැක්ටීරියාවකි. (2) දිලීරයකි. (3) වෛරසයකි. (4) පරපෝෂිතයෙකි.

32. අංගුත්තර නිකායේ රෝග සූත්‍රයේ සඳහන් පරිදි මිනිසාට වැළඳෙන මානසික රෝග හටගන්නා අකුසල මූල තුන,
(1) වාත, පිත, සෙම වේ. (2) ලෝභ, ද්වේශ, මෝහ වේ.
(3) ආපෝ, තේජෝ, වායෝ වේ. (4) ශ්‍රද්ධා, බුද්ධි, විතර්ක වේ.

33. පුද්ගලයෙකු බියපත් වූ හෝ කෝපයට පත්වූ අවස්ථාවක ස්‍රාවය වන හෝමෝනය නම්,
(1) ඇඩ්‍රිනලින් ය. (2) කෝටිසෝල් ය.
(3) ඇල්ඩොස්ටෙරෝන් ය. (4) නොරඇඩ්‍රිනලින් ය.

34. වෛද්‍ය පරීක්ෂණයකින් අනාවරණය වූ පරිදි භික්ෂූන් වහන්සේ නමකට දුර ඇති වස්තු පැහැදිලිව පෙනෙන අතර ළඟ ඇති වස්තු පැහැදිලිව නොපෙනේ. එම භික්ෂූන් වහන්සේ භාජනය වී ඇති දෘශ්‍යාබාධය,
(1) දුර දෘෂ්ටිකත්වයයි. (2) අවිදුර දෘෂ්ටිකත්වයයි.
(3) වර්ණ අන්ධතාවයි. (4) ග්ලූකොමාව යි.

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

35. මානසික රෝග සඳහා ප්‍රතිකාර කිරීමේදී අභිචාරාත්මක ප්‍රතිකාර ක්‍රමයක් වන්නේ,
(1) පරීක්ෂණ ය. (2) බෝධි පූජා පැවැත්වීමය.
(3) නිරීක්ෂණ ය. (4) ඖෂධ භාවිතය ය.

36. පුද්ගලයෙකු අනතුරකට පත්වූ අවස්ථාවක දී ප්‍රථමාධාරකරුවෙකු විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග කිහිපයක් පහත සඳහන් වේ.
- රෝගියා, දිවීමෙන් වැලැක්වීම
- රෝගියා බිම දිගා කරවීම
- රෝගියා ඝනකම් රෙද්දකින් එතීම
- රෝගියා පෙරළීම

ඔහු ප්‍රථමාධාර දී ඇත්තේ,
(1) ඇඳුම්වලට ගිනිගෙන ඇති පුද්ගලයෙකුට ය.
(2) කම්පනයට භාජනය වූ පුද්ගලයෙකුට ය.
(3) විදුලි සැර වැදුන පුද්ගලයෙකුට ය.
(4) සර්ප දෂ්ටනයකට භාජනය වූ පුද්ගලයෙකුට ය.

37. චරක ආචාර්යතුමාට අනුව 'ආයුර්වේදය' යනු,
(1) යහපත් ජීවිතය පිළිබඳ විස්තර කිරීම ය.
(2) අයහපත් ජීවිතය පිළිබඳ විස්තර කිරීම ය.
(3) දුක්ඛ ජීවිතය පිළිබඳ විස්තර කිරීම ය.
(4) දීර්ඝ ආයුෂ විඳීම සඳහා සුදුසු හා නුසුදුසු දේ පිළිබඳ විස්තර කිරීම ය.

38. 1961 ආයුර්වේද පනතට අනුව 'ආයුර්වේදය' නාමය යටතට පත්වූ වෛද්‍ය සම්ප්‍රදායයන් වන්නේ,
(1) දේශීය වෛද්‍ය ක්‍රමය, සිද්ධ වෛද්‍ය ක්‍රමය හා යුනානි වෛද්‍ය ක්‍රමය වේ.
(2) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, යුනානි වෛද්‍ය ක්‍රමය හා සිද්ධ වෛද්‍ය ක්‍රමය වේ.
(3) දේශීය වෛද්‍ය ක්‍රමය, සිද්ධ වෛද්‍ය ක්‍රමය හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය වේ.
(4) දේශීය වෛද්‍ය ක්‍රමය, සිද්ධ වෛද්‍ය ක්‍රමය, යුනානි වෛද්‍ය ක්‍රමය හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය වේ.

- පහත සඳහන් *A*, *B*, *C* සහ *D* යන සිද්ධි යුගල අධ්‍යයනය කොට ප්‍රශ්න අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*A* – (i) භික්ෂූන් වහන්සේලාගේ කායික තත්ත්වය අවබෝධකරගෙන දානය සැකසීම
(ii) භික්ෂූන් වහන්සේලා බෝනොවන රෝගවලට භාජනය වීම
*B* – (i) නිතිපතා සක්මන් භාවනාවෙහි නිරත වීම
(ii) භික්ෂූන් වහන්සේලාගේ කායික හා මානසික යහපැවැත්ම තහවුරු වීම
*C* – (i) වෛද්‍ය විද්‍යාත්මකව නිර්දේශ කර ඇති ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා ගැනීම හා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම
(ii) රෝගවලින් වැලකීමට හැකියාව ලැබීම
*D* – (i) මනසෙහි ඇතිවන අයහපත් සිතුවිලි මත ක්‍රියා කිරීම
(ii) යහපත් ධාර්මික කටයුතුවල නියැලීමේ හැකියාව ඇති වීම

39. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල වන්නේ,
(1) *A* සහ *B* ය. (2) *A* සහ *D* ය. (3) *B* සහ *C* ය. (4) *C* සහ *D* ය.

40. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල වන්නේ,
(1) *A* සහ *C* ය. (2) *A* සහ *D* ය. (3) *B* සහ *C* ය. (4) *B* සහ *D* ය.

* *



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

## 2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්

09 S I, II

(නව නිර්දේශය)

## (09) සෞඛ්‍ය විද්‍යාව - I, II

### සෞඛ්‍ය විද්‍යාව - II පත්‍රය

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය.
* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

**1.** මෙත් සිසිල පිරිවෙණෙහි ගිහි, පැවිදි ශිෂ්‍යයින් "යහපැවැත්ම තුළින් නිරෝගීව ජීවත් වෙමු." යන්න තේමා කොටගනිමින් මෙවර සෞඛ්‍ය දිනය සංවිධානය කර තිබුණි.

උදය වරුවේ පවත්වන ලද වෛද්‍ය සායනයට අවට පිරිවෙන්වල ගිහි, පැවිදි ශිෂ්‍යයන් හා දායක, දායිකාවෝ සහභාගි වූහ. එහිදී ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කිරීමේ දී බහුතරයක් ශිෂ්‍යයන් BMI සටහනෙහි කොළ පැහැති තීරුවට අයත් වුව ද කිහිප දෙනෙකු අධිබර හා ස්ථූලතාවට පත්ව ඇති බව අනාවරණය විය. ඔවුන්ට දියවැඩියාව වැනි බෝනොවන රෝග වැළඳීමේ අවදානමක් ඇති බැවින් අධික තෙල්, සීනි හා ලුණු අඩංගු ආහාර පරිභෝජනය අවම කිරීමට හා නිතිපතා ව්‍යායාමයෙහි නිරතවීමට උපදෙස් ලැබුණි.

වැඩිහිටි සායනයේ දී ඔවුන් කිහිප දෙනෙකු රාත්‍රී කාලයේ දී ඇස් නොපෙනීම වැනි අක්ෂි රෝග තත්ත්වවලට ගොදුරු වී ඇති බව අනාවරණය විය. එබැවින් ඔවුන්ගේ ආහාරයට කොළ පැහැති එළවළු, පලතුරු එක් කිරීමට වෛද්‍ය උපදෙස් ලැබුණි.

සවස් කාලයේ පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ "ආරොග්‍යපරමා ලාභා" ගාථාව මුල් කරගෙන බුදු දහමට අනුව සෞඛ්‍ය සංරක්ෂණයෙහි වැදගත්කම පහදා දුන් සේක. එහිදී සුව පහසු දිවියක් ගත කිරීමට අවශ්‍ය පිළිවෙත් දෙක වන "සප්පාය" හා "පාරිසුද්ධිය" පැහැදිලි කරන ලද අතර සෞඛ්‍යය සඳහා වැදගත් වන "ආහාරසප්පාය", විහරණසප්පාය" ආදි කරුණු පහක් පිළිබඳ අවධාරණය කරන ලදී. තවද පාරිසුද්ධිය රැක ගැනීමට චීවර, සෙනසුන ආදී පිරිසිදුව තබාගත යුතු අංග පිළිබඳව ද පැහැදිලි කරන ලදී.

එදින දායක, දායිකාවෝ, ස්වාභාවික ආහාරවලින් සහභාගිවූවන්ට සංග්‍රහ කළහ. වැඩසටහන අවසානයේ දී සැවොම මෛත්‍රී භාවනාවට සහභාගි වීමෙන් අනතුරුව සැහැල්ලු මනසින් යුතුව පිරිවෙන් භූමියෙන් විසිර ගියහ.

මෙම සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) වෛද්‍යවරුන් විසින් ශරීර ස්කන්ධ දර්ශනය (BMI) ගණනය කිරීම සඳහා භාවිත කරන ලද ශාරීරික මිනුම් දෙක සඳහන් කරන්න.

(ii) වෛද්‍ය පරීක්ෂණයේ දී අනාවරණය වූ ස්ථූලතාවය හා අධිබර තත්ත්වයට පත්වූ ශිෂ්‍යයන්, ශරීර ස්කන්ධ දර්ශක සටහනෙහි ඇතුළත් වන වර්ණ පරාසයන් ලියා දක්වන්න.

(iii) අධිබර හා ස්ථූලතාවට පත්වූවන්ට වැළඳිය හැකි සිද්ධියේ සඳහන් නොවන වෙනත් බෝ නොවන රෝග දෙකක් සඳහන් කරන්න.

(iv) ඉහත (iii) හි ඔබ සඳහන් කළ රෝගවලින් වැලකීමට අනුගමනය කළ යුතු සිද්ධියේ සඳහන් නොවන වෙනත් ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(v) සිද්ධියේ සඳහන් අක්ෂි දුර්වලතාව හැර වැඩිහිටියන් අතර සුලබව දැකිය හැකි දෘශ්‍යාබාධ දෙකක් ලියන්න.

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(vi) වෛද්‍යවරයාගේ උපදෙස්වලට අනුව ව්‍යායාම ලබා ගැනීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට නිරතවිය හැකි ක්‍රියාකාරම් දෙකක් ලියන්න.

(vii) පිරිවෙණාධිපති ස්වාමින් වහන්සේ විසින් පැහැදිලි කරන ලද 'සප්පාය' හා 'පාරිසුද්ධිය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(viii) බුදු දහමෙහි සඳහන් සෞඛ්‍යය සඳහා මහෝපකාරී වන, සිද්ධියේ සඳහන් නොවන වෙනත් 'සප්පාය' දෙකක් ලියා දක්වන්න.

(ix) 'පාරිසුද්ධිය' රැක ගැනීම සඳහා චීවර, සෙනසුන හැර පිරිසිදුව ගබා ගතයුතු වෙනත් අංග දෙකක් සඳහන් කරන්න.

(x) සෞඛ්‍ය දිනයෙහි වැඩසටහනට සහභාගිවූවන්ට නිරතවිය හැකි, වෙනත් භාවනා ක්‍රම දෙකක් සඳහන් කරන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

**2.** ගංවතුර හේතුවෙන් සලාක දානය භික්ෂූන් වහන්සේලා වෙත ලබා දීමට නොහැකි බැවින් දායකයෝ එක්ව, කිරි ආහාර වර්ග, එළවළු, පලතුරු, වියළි ආහාර, පොල්කිරි පැකට් වැනි නිෂ්පාදිත ආහාර වර්ග ආදිය පන්සල වෙත භාර දුන්හ. ප්‍රවාහනයේ දී සමහර එළවළු, පලතුරු තැලුණු අතර පොල්කිරි පැකට්ටුවල ඇසුරුම් ඉරීමට ලක් විය. මෙම කාල සීමාව තුළ පෝෂණ ගුණය රැකදෙන පරිදි දානය පිළියෙල කිරීමේ කාර්ය භික්ෂූන් වහන්සේ වෙත පැවරුණි.

(i) (අ) භික්ෂූන් වහන්සේලා වෙත ලැබී ඇති ආහාර ද්‍රව්‍යවලින් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට ඉක්මනින් ම පත්විය හැකි ආහාර වර්ග දෙකක් ලියන්න.

(ආ) ඉහත (i) (අ) හි ඔබ සඳහන් කළ ආහාර, පරිභෝජනයට නුසුදුසු බව හඳුනා ගැනීමට උපකාරී වන, තැලුණු ස්වභාවය හැර වෙනත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) භික්ෂූන් වහන්සේලා ආහාර පිළියෙල කිරීමේ දී පෝෂණ ගුණයට හානි නොවන පරිදි පිළියෙල කරගත හැකි ආකාර තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) (අ) භික්ෂූන් වහන්සේලා විසින්, නිෂ්පාදිත ආහාරයක්, පරිභෝජනය සඳහා තෝරා ගැනීමේදී සිද්ධියේ සඳහන් ලක්ෂණය හැර, අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු තුනක් සඳහන් කරන්න.

(ආ) භික්ෂූන් වහන්සේලා වෙත ලැබුණු, සිද්ධියේ දැක්වෙන ආහාර වර්ග කල් තබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) ආශ්වාසය හා ප්‍රාශ්වාසය යන්න කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 02 යි)*

(ii) බාහිර පරිසරයේ සිට පෙනහලු තෙක් ශ්වසනය සඳහා වාතයේ ගමන් මග දක්වා ඇති පහත සඳහන් ගැලීම් සටහන ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරගන්න.

දී ඇති වචන භාවිත කොට එම සටහන සම්පූර්ණ කරන්න.

ග්‍රසනිකාව, ශ්වාසනාලිකා, නාස් කුහරය, ස්වරාලය, අනුශ්වාසනාලිකා, ස්වාසනාලය




*(ලකුණු 03 යි)*

(iii) (අ) ශ්වසන පද්ධතිය ආශ්‍රිතව වැළදෙන බෝවන සහ බෝනොවන රෝග දෙක බැගින් ලියන්න.

(ආ) ශ්වසන පද්ධතියේ ස්වස්ථතාව රැක ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

[ 9 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**4.**




පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම සටහන උපයෝගී කරගන්න.

(i) මෙම සටහනේ රෝග අතුරෙන් සංවේදන ඉන්ද්‍රියයන් හා සම්බන්ධ රෝග දෙකක් නම් කර එම රෝගවලට අදාළ සංවේදන ඉන්ද්‍රියයන් දෙක ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) (අ) සටහනේ දක්වෙන රෝග අතුරෙන් ආහාර ජීරණ පද්ධතිය ආශ්‍රිත රෝග දෙකක් නම් කරන්න.

(ආ) ඉහත (4) (ii) (අ) හි ඔබ සඳහන් කළ රෝග දෙකෙන් වැළකීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් බැගින් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) (අ) සටහනේ දැක්වෙන රෝගවලින් තුන්වෙනි ශික්ෂාපදය කඩකිරීම හේතුවෙන් වැළඳිය හැකි රෝගය කුමක් ද?

(ආ) (iii) (අ) හි සඳහන් කළ රෝගයේ රෝග කාරකය නම් කරන්න.

(ඉ) (iii) (අ) හි සඳහන් කළ රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තුනක් ලියන්න. *(ලකුණු 05 යි)*

**5.** (i) පිරිසිදු ජලය දූෂණය වූ විට හඳුනා ගත හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සෞඛ්‍යවත් ජීවිතයක් ගත කිරීම සඳහා සිරුර තුළදී ජලය අවශ්‍ය වන්නේ කුමක් සඳහා දැයි දැක්වීමට කරුණු තුනක් ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) පිරිවෙණෙහි දී භාවිත කළ හැකි ජල සංරක්ෂණ ක්‍රම පහක් ලියන්න. *(ලකුණු 05 යි)*

**6.** (i) දේශීය ප්‍රථමාධාරයේ දී 'අත් බෙහෙත්' යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? *(ලකුණු 02 යි)*

(ii) ජීවිතය බේරා ගැනීම, ප්‍රථමාධාර ලබා දීමේ ප්‍රධාන අරමුණකි. ප්‍රථමාධාර ලබා දීමේ අනෙක් අරමුණු තුන ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) පුද්ගලයෙකුගේ හෘද අකර්මණ්‍යතාවක දී, ප්‍රථමාධාරකරුවෙකු ලෙස ඔබ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**7.** (i) ආයුර්වේදයේ එන 'කාය චිකිත්සාව' හා 'ශල්‍යාංග චිකිත්සාව' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ආයුර්වේදයේ දී සමබල ආහාරයක අඩංගු පෝෂක හඳුන්වන රස හය සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) ආයුර්වේදයේ ප්‍රතිකාර සඳහා යොදා ගන්නා පංචකර්ම චිකිත්සා විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

[ 10 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**8.** මානසික රෝග ඇතිවීම සඳහා බලපාන හේතු ජානමය හා පාරිසරික හේතු ලෙස දෙයාකාර වේ.

(i) මානසික රෝග ඇතිවීමට බලපාන පවුල් පරිසරය හා සම්බන්ධ ගැටලු **දෙකක්** ඉදිරිපත් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) බුදු දහමට අනුව මානසික සුවයක් නොමැති විවිධ චරිතවලට ගැළපෙන කමටහන් දක්වා ඇත. එවැනි චරිත තුනක් සඳහන් කර ඒ ඒ චරිතවලට ගැළපෙන කමටහන් මොනවාදැයි ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) (අ) මානසික ආතතියෙන් පෙළෙන පුද්ගලයෙකුට, ආතතිය අවම කර ගැනීම සඳහා ඔබ ලබා දෙන උපදෙස් **තුනක්** දක්වන්න.

(ආ) මානසික ආතතිය පාලනය කිරීම සඳහා භාවනාවෙන් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka